# කෝවිඩ්-19 එන්නත් වාර්තාවක් ලබා ගැනීම

NSW GOVERNMENT

Sinhalese

## ඔබගේ කෝවිඩ්-19 එන්නත් වාර්තාවක් ලබා ගන්නේ කෙසේද?

ඔබගේ එන්නත ලබා ගැනීමෙන් පසුව, ඔබගේ **immunisation history statement** (ප්‍රතිශක්තිකරණ ඉතිහාසය සම්බන්ධ ප්‍රකාශනයේ) ඔබගේ කෝවිඩ්-19 එන්නත සම්බන්ධ සාක්ෂි වාර්තා වනු ඇත.

ඔබ හට සියළු මාත්‍රා ලැබීමෙන් පසුව, ඔබගේ **COVID-19 digital certificate** (කෝවිඩ්-19 ඩිජිටල් සහතිකය) සඳහා ප්‍රවේශය ලැබෙනු ඇත.




පහත ආකාරයට ඔබගේ කෝවිඩ්-19 එන්නත සම්බන්ධ සාක්ෂි ලබා ගත හැකිය:

- **Medicare online account** (මෙඩිකෙයාර් මාර්ගස්ථ ගිණුම)
- **Express Plus Medicare app** (එක්ස්ප්‍රස් ප්ලස් මෙඩිකෙයාර් ඇප්)
- **My Health Record** (මයි හෙල්ත් රෙකෝඩ්)
- **Individual Healthcare Identifiers Service** (තනි පුද්ගල සෞඛ්‍යය රැකවරණ හඳුනාගැනීමේ සේවාව)
- **Australian Immunisation Register** (ඕස්ට්‍රේලියානු ප්‍රතිශක්තිකරණ ලේඛණය)

### මෙඩිකෙයාර් මාර්ගස්ථ ගිණුම

1. ඔබගේ **myGov (මයිගව්)** ගිණුමට සයින් ඉන් වී (my.gov.au) **Medicare** (මෙඩිකෙයාර්) තෝරා ගන්න
2. **Immunisation history (ප්‍රතිශක්තිකරණ ඉතිහාසය)** කොටසින්, **View immunisation history (ප්‍රතිශක්තිකරණ ඉතිහාසය බලන්න)** තෝරා ගන්න.
3. ඔබගේ නම තෝරා ගන්න
4. **View immunisation history statement (PDF) (ප්‍රතිශක්තිකරණ ඉතිහාසය සම්බන්ධ ප්‍රකාශනය (පීඩීඑෆ්))** හෝ **View COVID-19 digital certificate (PDF)(කෝවිඩ්-19 ඩිජිටල් සහතිකය (පීඩීඑෆ්) බලන්න)** වෙත ක්ලික් කරන්න

### එක්ස්ප්‍රස් ප්ලස් මෙඩිකෙයාර් ඇප්

1. ඇප් එක විවෘත කර සයින් ඉන් වන්න
2. **Services (සේවා)** කොටසින්, **Immunisation history (ප්‍රතිශක්තිකරණ ඉතිහාසය)** තෝරා ගන්න
3. ඔබගේ නම තෝරා ගන්න
4. **View immunisation history statement (PDF)(ප්‍රතිශක්තිකරණ ඉතිහාසය සම්බන්ධ ප්‍රකාශනය (පීඩීඑෆ්))** හෝ **View COVID-19 digital certificate (PDF)(කෝවිඩ්-19 ඩිජිටල් සහතිකය බලන්න (පීඩීඑෆ්))** වෙත ක්ලික් කරන්න.

### මයි හෙල්ත් රෙකෝඩ්

ඔබට මයි හෙල්ත් රෙකෝඩ් වෙතින්ද කෝවිඩ්-19 සම්බන්ධ සාක්ෂි ලබා ගත හැකිය.

ඔබට දැනටමත් මයි හෙල්ත් රෙකෝඩ් ඇතිනම්:

1. ඔබගේ **myGov (මයිගව්)** ගිණුමට සයින් ඉන් වී (my.gov.au) තෝරා **My Health Record (මයි හෙල්ත් රෙකෝඩ්) තෝරා ගන්න**
2. ඔබගේ මයි හෙල්ත් රෙකෝඩ් විවෘත කරන්න
3. ඔබගේ **Record Home (වාර්තා නිවෙස්)** පිටුව හෝ **Immunisations view (ප්‍රතිශක්තිකරණය බලන්න)** පිටුව (**Documents, Immunisations (ලේඛණ, ප්‍රතිශක්තිකරණ) තෝරා ගන්න**)

මයි හෙල්ත් රෙකෝඩ් එකක් ඔබට නැති වුවද, මෙඩිකොයාර් කාඩ් පතක් තිබේ නම්:

1. ඔබගේ **myGov (මයිගව්)** ගිණුමට සයින් ඉන් වී (my.gov.au), **My Health Record (මයි හෙල්ත් රෙකෝඩ්)** සමඟ සම්බන්ධ කර ගන්න
2. ඔබගේ අනන්‍යතාවය තහවුරු කර, මයි හෙල්ත් රොකෝඩ් එකක් විවෘත කරන්න. ඔබගේ මයි හෙල්ත් රොකෝඩ් හි ප්‍රතිශක්ති තොරතුරු (මෙඩිකෙයාර් තොරතුරු) ඇතුලත් කිරීම සම්බන්ධයෙන් 'ඔව්' යන්න තෝරා ගන්න.
3. ඔබගේ මයි හෙල්ත් රෙකෝඩ් විවෘත කරන්න
4. බගේ **Record Home (වාර්තා නිවෙස්)** පිටුව වෙතින් හෝ ඔබගේ ප්‍රතිශක්තිකරණ බලන පිටුවෙන් ඔබගේ එන්නත් සම්බන්ධයෙන් ප්‍රවේශ වන්න

# කෝවිඩ්-19 එන්නත් වාර්තාවක් ලබා ගැනීම

## තනි පුද්ගල සෞඛ්‍යය රැකවරණ සේවාව (ඔබට මෙඩිකෙයාර් කාඩ් පතක් නොමැති නම්)

ඔබට මෙඩිකෙයාර් කාඩ් පතක් නොමැති නම් සහ ඔබට මාර්ගස්ථව ඔබගේ එන්නත් සම්බන්ධ සාක්ෂි ලබා ගැනීමට අවශ්‍ය නම්, ඔබට තනි පුද්ගල සෞඛ්‍යය රැකවරණ හඳුනා ගැනීමක් Individual Healthcare Identifier (IHI) අවශ්‍යවේ. ඔබට දැනටමත් IHI ගිණුමක් නැතිනම්, මාර්ගස්ථව ඒ සඳහා අයදුම් කළ හැකිය.

වැඩිදුර විස්තර සඳහා බලන්න:

[www.servicesaustralia.gov.au/individuals/services/medicare/individual-healthcare-identifiers/how-get-ihi](www.servicesaustralia.gov.au/individuals/services/medicare/individual-healthcare-identifiers/how-get-ihi)

ඔබ විසින් IHI ලබා ගත් පසු, මයිගව් ඔස්සේ ඔබගේ එන්නත් සම්බන්ධ සාක්ෂි ලබා ගත හැකිය.

1. ඔබගේ **myGov (මයිගව්)** ගිණුමට සයින් ඉන් වී (my.gov.au), **Individual Healthcare Identifiers service (තනි පුද්ගල සෞඛ්‍යය රැකවරණ හඳුනාගැනීමේ සේවාව)** තෝරා ගන්න
2. **Services (සේවා)** කොටසින්, **Immunisation History (ප්‍රතිශක්තිකරණ ඉතිහාසය)** තෝරා ගන්න
3. **View immunisation history statement (PDF)(ප්‍රතිශක්තිකරණ ඉතිහාසය සම්බන්ධ ප්‍රකාශනය (පීඩීඑෆ්))** හෝ **View COVID-19 digital certificate (PDF)(කෝවිඩ්-19 ඩිජිටල් සහතිකය බලන්න (පීඩීඑෆ්))** වෙත ක්ලික් කරන්න.

## ඕස්ට්‍රේලියානු ප්‍රතිශක්තිකරණ ලේඛණය

ඔබට මාර්ගස්ථව කෝවිඩ්-19 එන්නත සම්බන්ධ සාක්ෂි ලබා ගත නොහැකි නම්,

සදුදා සිට සිකුරාදා දක්වා පෙව 8 සිට පව 5 දක්වා දුරකථන අංක **1800 653 809** ඔස්සේ **Australian Immunisation Register (ඕස්ට්‍රේලියානු ප්‍රතිශක්තිකරණ ලේඛණය)** අමතන්න.

ඔබගේ **immunisation history statement (ප්‍රතිශක්තිකරණ ඉතිහාසය සම්බන්ධ ප්‍රකාශනය)** ඔබ වෙත එවන ලෙසට ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න.

තැපෑලෙන් පැමිණීමට දින 14 ක කාලයක් ගත හැකිය.

ඔබට භාෂා පරිවර්තකයෙකු අවශ්‍ය නම්, දුරකථන අංක **131 450** ඔස්සේ භාෂා පරිවර්තන සහ තෝල්ක සේවාව **(Translating and Interpreting Service (TIS))** අමතන්න.

## ප්‍රයෝජනවත් සම්බන්ධතා පුරුක්

ඔබගේ ප්‍රතිශක්තිකරණ ඉතිහාසය සම්බන්ධ ප්‍රකාශනය වෙත ප්‍රවේශ විය හැකි ආකාරය සම්බන්ධ වැඩි විස්තර සඳහා **scan the QR code below** (පහත කිව්. ආර්. කේතය ස්කෑන් කරන්න)

නිව් සවුත් වේල්ස්හි කෝවිඩ්-19 එන්නත් වැඩ සටහන සම්බන්ධ වැඩි විස්තර සඳහා පහත **scan the QR code** (කිව්. ආර්. කේතය ස්කෑන් කරන්න)

ඔබගේ කෝවිඩ්-19 එන්නත සම්බන්ධව පහසුවෙන්ම මාර්ගස්ථව සාක්ෂි ලබා ගත හැකි ආකාරය සොයා ගැනීම සඳහා **පහත කිව්. ආර්. කේතය ස්කෑන් කරන්න.**

NSW GOVERNMENT

වැඩිදුර විස්තර සඳහා **nsw.gov.au වෙත පිවිසෙන්න**

August 2021 © NSW Health.